මාධ්‍ය නිවේදනය

ஊடக வெளியீடு

PRESS RELEASE



Tel : 011 2 386572 Fax : 011 2 333717

ජනාධිපති මාධ්‍ය අංශය,ජනාධිපති කාර්යාලය,කොළඹ 01

ஜனாதிபதி ஊடகப் பிரிவு, ஜனாதிபதி அலுவலகம், கொழும்பு 01

President's Media Division, President's Office, Colombo 01



නිවේදන අංක - 278

2020-08-12 ප.ව 11.55 ට


# නව රජයේ අමාත්‍යවරු ජනපති ඉදිරියේ දිවුරුම් දෙති.

- **අගමැතිතුමා ඇතුළුව කැබිනට් ඇමතිවරු 25යි ...**
- **රාජ්‍ය අමාත්‍යවරු 39 දෙනෙක් ...**
- **දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරු 23 ක් ...**

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ප්‍රමුඛ නව රජයේ කැබිනට් සහ රාජ්‍ය අමාත්‍යවරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඉදිරියේ දිවුරුම් දෙති.

දිවුරුම්දීම අද (12) පෙරවරුවේ මහනුවර ශ්‍රී දළදා මාළිගා පරිශ්‍රයේ ඓතිහාසික මඟුල් මඩුවේදී සිදු විය.

අනාගතයේදී අපේක්ෂා කරන සෞභාග්‍යවත් දේශය ගොඩනැගීම සඳහා කැපවන කාර්යශූර අමාත්‍ය මණ්ඩලයක අවශ්‍යතාව ජනාධිපතිතුමා විසින් පෙන්වා දී තිබිණ.

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව ජාතික වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට ප්‍රායෝගිකව සහ යතාර්ථවාදීව අමාත්‍ය මණ්ඩලයේ සංයුතිය සැලසුම් කර තිබේ. අමාත්‍යාංශය ව්‍යුහය සැකසීමේ දී ජාතික ආරක්ෂාව, ආර්ථික සංවර්ධනය, යටිතල පහසුකම්, අධ්‍යාපනය, සෞඛ්‍යය හා ක්‍රීඩා යන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරිණ.

අභිනව කැබිනට් මණ්ඩලයට අග්‍රාමාත්‍යතුමා ඇතුළුව 25 දෙනෙක් අයත් වෙති. රාජ්‍ය අමාත්‍යවරුන් ගණන 39කි. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරු ලෙස 23 දෙනෙක් පත් කරනු ලැබ සිටිති.

මහා සංඝරත්නය සෙත් පිරිත් සජ්ජායනා කර නව අමාත්‍ය මණ්ඩලයට හා තේරිපත් වූ මන්ත්‍රිවරුන්ට ආශිර්වාද පළ කළහ.

දිස්ත්‍රික් කමිටු සභාපතිවරු වෙත පත්වීම් ප්‍රදානය ජනාධිපතිතුමා අතින් ප්‍රථමයෙන් සිදු කෙරිණ.

**<u>දිස්ත්‍රික් කමිටු සභාපතිවරු</u>**

| | | |
|---|---|---|
| 01- ප්‍රදීප් උදුගොඩ මහතා | - | කොළඹ දිස්ත්‍රික්කය |
| 02- සහන් ප්‍රදීප් විතාන මහතා | - | ගම්පහ දිස්ත්‍රික්කය |
| 03- සංජීව එදිරිමාන්න මහතා | - | කළුතර දිස්ත්‍රික්කය |
| 04- වසන්ත යාපා බණ්ඩාර මහතා | - | මහනුවර දිස්ත්‍රික්කය |
| 05- එන්. නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා | - | මාතලේ දිස්ත්‍රික්කය |
| 06- එස්.බී. දිසානායක මහතා | - | නුවරඑළිය දිස්ත්‍රික්කය |
| 07- සම්පත් අතුකෝරළ මහතා | - | ගාල්ල දිස්ත්‍රික්කය |
| 08- නිපුණ රණවක මහතා | - | මාතර දිස්ත්‍රික්කය |
| 09- උපුල් ගලප්පත්ති මහතා | - | හම්බන්තොට දිස්ත්‍රික්කය |
| 10- අංගජන් රාමනාදන් මහතා | - | යාපනය දිස්ත්‍රික්කය |

(02 පිටුවට)

11- ඩග්ලස් දේවානන්ද මහතා - කිලිනොච්චිය දිස්ත්‍රික්කය
12- කේ. දිලීප මහතා - වව්නියාව දිස්ත්‍රික්කය
13- කේ. කාදර් මස්තාන් මහතා - මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්කය
14- ඩී. වීරසිංහ මහතා - අම්පාර දිස්ත්‍රික්කය
15- කපිල අතුකෝරල මහතා - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
16- ගුණපාල රත්නසේකර මහතා - කුරුණෑගල දිස්ත්‍රික්කය
17- අශෝක ප්‍රියන්ත මහතා - පුත්තලම දිස්ත්‍රික්කය
18- එච්. නන්දනසේන මහතා - අනුරාධපුර දිස්ත්‍රික්කය
19- අමරකීර්ති අතුකෝරළ මහතා - පොළොන්නරුව දිස්ත්‍රික්කය
20- සුදර්ශන දෙනිපිටිය මහතා - බදුල්ල දිස්ත්‍රික්කය
21- කුමාරසිරි රත්නායක මහතා - මොණරාගල දිස්ත්‍රික්කය
22- අකිල එල්ලාවල මහතා - රත්නපුරය දිස්ත්‍රික්කය
23- රාජිකා වික්‍රමසිංහ මහත්මිය - කෑගල්ල දිස්ත්‍රික්කය

<u>නව රාජ්‍ය අමාත්‍යවරු</u>

01- චමල් රාජපක්ෂ මහතා - අභ්‍යන්තර ආරක්ෂක ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ
02- පියංකර ජයරත්න මහතා - විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපොළ විවිධාංගීකරණ
03- දුමින්ද දිසානායක මහතා - සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන
04- දයාසිරි ජයසේකර මහතා -බතික්, අත්යන්ත්‍ර, රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන
05- ලසන්ත අලගියවන්න මහතා - සමූපකාර සේවා, අළෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ
06- සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මිය -බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන
07- අරුන්දික ප්‍රනාන්දු මහතා -පොල්, කිතුල්, තල් හා රබර් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ
08- නිමල් ලන්සා මහතා -ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම්
09- ජයන්ත සමරවීර මහතා -ගුදම් පහසුකම්, බහලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන
10- රොෂාන් රණසිංහ මහතා -ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන
11- කනක හේරත් මහතා -සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ වතු ආශ්‍රිත බෝග වගා තේ කර්මාන්ත ශාලා නවීකරණය හා තේ අපනයන ප්‍රවර්ධන
12- විදුර වික්‍රමනායක මහතා - ජාතික උරුම, ප්‍රසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු
13- ජානක වක්කුඹුර මහතා -උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන
14- විජිත බේරුගොඩ මහතා - දහම්පාසල්, භික්ෂු අධ්‍යාපන, පිරිවෙන් හා බෞද්ධ විශ්ව විද්‍යාල
15- ෂෙහාන් සේමසිංහ මහතා - සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන , රාජ්‍ය සම්පත් සංවර්ධන
16- මොහාන් ද සිල්වා - පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමි නාශක භාවිත නියාමන
17- ලොහාන් රත්වත්තේ මහතා - මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත
18- දිලුම් අමුණුගම මහතා - වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත
19- විමලවීර දිසානායක මහතා - වනජීවී රැකවරණය, අලි වැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙළවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන
20- තාරක බාලසූරිය මහතා - කලාපීය සහයෝගිතා කටයුතු

| | |
|---|---|
| 21- ඉන්දික අනුරුද්ධ මහතා | - ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන |
| 22- කංචන විජේසේකර මහතා | - විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන |
| 23- සනත් නිශාන්ත මහතා | - ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන |
| 24- සිරිපාල ගම්ලත් මහතා | - මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස, පොදු යටිතල පහසුකම් සංවර්ධන |
| 25- සරත් වීරසේකර මහතා | - පලාත් සභා හා පළාත් පාලන කටයුතු |
| 26- අනුරාධ ජයරත්න මහතා | -ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන |
| 27- සදාසිවම් වියාලේන්ද්‍රන් මහතා | -තැපැල් සේවා හා ජනමාධ්‍යවේදී වෘත්තීය සංවර්ධන |
| 28- තේනුක විදානගමගේ මහතා | - ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන |
| 29- සිසිර ජයකොඩි මහතා | - දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය |
| 30- පියල් නිශාන්ත ද සිල්වා මහතා | - කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා |
| 31- ප්‍රසන්න රණවීර මහතා | - වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන |
| 32- ඩී.වී. චානක මහතා | - ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන |
| 33- ඩී.බී. හේරත් මහතා | - පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත |
| 34- ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා | - වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ලූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම |
| 35- නාලක ගොඩහේවා මහතා | - නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ අපද්‍රව්‍ය බැහැරවීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු |
| 36- ජීවන් තොණ්ඩමන් මහතා | - වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් |
| 37- අජිත් නිවාඩ් කබ්රාල් මහතා | - මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ |
| 38- සීතා අරඹේපොළ මහත්මිය | - නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් |
| 39- චන්න ජයසුමන මහතා | - ඖෂධ නිෂ්පාදනය, සැපයුම් හා නියාමන |

<u>කැබිනට් අමාත්‍යවරු</u>

| | |
|---|---|
| 01- අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා | - ආරක්ෂක |
| 02- මහින්ද රාජපක්ෂ මැතිතුමා | - මුදල් |
| 03- මහින්ද රාජපක්ෂ මැතිතුමා | - බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු |
| 04- මහින්ද රාජපක්ෂ මැතිතුමා | - නාගරික සංවර්ධනය හා නිවාස |
| 05- නිමල් සිරිපාල ද සිල්වා මහතා | - කම්කරු |
| 06- ජී.එල්. පීරිස් මහතා | - අධ්‍යාපන |
| 07- පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය | - සෞඛ්‍ය |
| 08- දිනේෂ් ගුණවර්ධන මහතා | - විදේශ |
| 09- ඩග්ලස් දේවානන්ද මහතා | - ධීවර |
| 10- ගාමිණී ලොකුගේ මහතා | - ප්‍රවාහන |
| 11- බන්දුල ගුණවර්ධන මහතා | - වෙළෙඳ |
| 12- ආර්.එම්.සී.බී. රත්නායක මහතා | -වනජීවී හා වන සංරක්ෂණ |
| 13- ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා | - රාජ්‍ය සේවා, පළාත් සභා හා පලාත් පාලන |

| | | |
|---|---|---|
| 14- කෙහෙළිය රඹුක්වැල්ල මහතා | - | ජනමාධ්‍ය |
| 15- චමල් රාජපක්ෂ මහතා | - | වාරිමාර්ග |
| 16- ඩලස් අලහප්පෙරුම මහතා | - | විදුලිබල |
| 17- ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා | - | මහාමාර්ග |
| 18- විමල් වීරවංශ මහතා | - | කර්මාන්ත |
| 19- මහින්ද අමරවීර මහතා | - | පරිසර |
| 20- එස්.එම්. චන්ද්‍ර සේන මහතා | - | ඉඩම් |
| 21- මහින්දානන්ද අළුත්ගමගේ මහතා | - | කෘෂිකර්ම |
| 22- වාසුදේව නානායක්කාර මහතා | - | ජලසම්පාදන |
| 23- උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා | - | බලශක්ති |
| 24- රමේෂ් පතිරණ මහතා | - | වැවිලි |
| 25- ප්‍රසන්න රණතුංග මහතා | - | සංචාරක |
| 26- රෝහිත අබේගුණවර්ධන මහතා | - | වරාය හා නාවික |
| 27- නාමල් රාජපක්ෂ මහතා | - | තරුණ හා ක්‍රීඩා |
| 28- අලී සබ්‍රි මහතා | - | අධිකරණ |

දිවුරුම් දීමෙන් අනතුරුව ජනාධිපතිතුමා සහ අගමැතිතුමා ප්‍රමුඛ නව අමාත්‍ය මණ්ඩලය දළදා වහන්සේ වැඳ ආශිර්වාද ලබා ගත්හ.

දළදා මාළිගා පරිශ්‍රයේ පත්තිරුප්පුව ඉදිරිපිට සමූහ ඡායාරූපයට පෙනී සිටීමෙන් පසුව උත්සවයේ කටයුතු සමාප්ත විය.

**මොහාන් කරුණාරත්න**
**අධ්‍යක්ෂ**
**ජනාධිපති මාධ්‍ය අංශය**

**2020-08-12**